# බෙන්තර ගලපාත පුරාණ රජමහා විහාරයේ කලා ලක්ෂණ

ඩී.ඩී. භාග්‍යා ගිම්හානි[1]

බස්නාහිර සහ දකුණු පළාත් සීමා කෙරෙන බෙන්තර ග්‍රාමයේ පිහිටි බෙන්තර ගලපාත රජමහා විහාරය අනුරාධපුර යුගයේ සිට මහනුවර යුගය දක්වා ද ඉන් ඉක්බිති විදේශීය ආභාසයන් සහිතව ද යුග ගණනාවක් පසු කරමින් විවිධ කලා අංග එක් වෙමින් වර්තමානය තෙක් පැවතෙන්නකි. මෙහිදී අධ්‍යයනයට ලක්වනුයේ ඒ පිළිබඳවය. ස්ථානීය ගවේෂණ ක්‍රමවේදය යටතේ දත්ත ඒකරාශී කරගනිමින් සමස්ත විහාර පරිශ්‍රය තුළ අධ්‍යයනයක නිරත විය. දත්ත වාර්තාකරණයේ ප්‍රමුඛ ක්‍රමවේදය වූයේ ඡායාරූපකරණයයි. විහාර භූමිය පෞරාණික පොකුණ, ගල් ළිඳ, දඹදෙණි යුගයට අයත් ශිලාලේඛනය, කැටයම් සහිත ගල් උළුවස්ස, ගල්කණු, මහාකාශ්‍යප මහරහතන් වහන්සේගේ ධාතූන් තැන්පත් කරන ලදැයි සැලකෙන දගැබ, අනුරපුර මහනුවර අවධීන්හි සඳකඩපහණ, මුරගල්, කැටයම්, සිතුවම්, මූර්ති යනාදීන්ගෙන් සමලංකෘතය. නෘත්‍ය වාදන ශිල්පීන් හා ශිල්පිනියන්ගේ කැටයම් සහිත ලියවැලාකාරයෙන් නිරූපිත ගල් උළුවස්ස මෙම ස්ථානයට අනන්‍ය වූ ලක්ෂණ පෙන්වයි. අඩි 7 ක් උස අඟල් 55 ක් උස් වන එහි පළල අඩි 5 අඟල් 9 ක් වේ. මෙය පෘතුගීසි සංහාරයක දී කොටස් තුනකට කැඩී ගොස් ඇති අතර වර්තමානය වන විට ප්‍රතිසංස්කරණය කර මහනුවර සම්ප්‍රදයට අනුකූල පියස්සකින් ආවරණය කර ඇත. ගල් උළුවස්ස පිහිටුවා ඇති ගල් පඩිකඳෙහි කිඹිසි මුහුණක් සහිත ලියවැලකි. බොහෝ විට කිඹිසි මුහුණ මකර තොරන්වල ඉහළින් යෙදෙන මුත් මෙහි පඩිපෙළෙහි යෙදීම ලාක්ෂණික වේ. දකුණු පස මූලාරම්භයේ වන නළඟන රුවෙහි හිසින් ලියවැල ඇරඹී ක්‍රමයෙන් නර්තන ශිල්පිනිය, බෙරකරු, තාලම්පට හඩවන්නිය, බටනලා වාදක, කරණම්කරු යනාදීන් සමඟ වම්පස නළඟන හිසින් අවසන් වේ. මහනුවර යුගයේ පිළිමගෙය තුළ දියරළාකාරයේ සිවුර, පාදන්තයට විහිදි බුදුරැස් මාලාව, සිරස්පත ආදී ලක්ෂණ සහිත හිඳි හිටි පිළිම ද අඛණ්ඩකථන විලාසයේ සිතුවමින් ද යුක්ත ය. පැරණි විහාර වියන්තලයේ ජ්‍යාමිතික නෙලුම් මල් මෝස්තරයකි. රාශි චක්‍රය ඇඳි සිතුවම මධ්‍යයේ DOLOSRASIYA යනුවෙන් සටහන් කර තිබීම විශේෂිතය. සාම්ප්‍රදයික සිතුවම් කලාවට විදේශීය ආභාසය එක් වූ අවස්ථාවක් ලෙස කතෝලික පල්ලි ආශ්‍රිත දේවදූතයන්ට සමාන රුව සහිත දෙර දෙපස පටු බිත්ති තීරවල මල් කූඩයක් අතින් ගත් ගිලිහෙන ඇඟලුමින් යුත් සුකුමාර පුරුෂ රූ වෙයි. විහාර දොරටුව මුදුනෙහි ඇති සිංහ රුව ඕලන්ද බලකොටුවල දැකගත හැකි සිංහ රුවට සමාන ලක්ෂණ දරයි. බුද්ධ ප්‍රතිමා ගෘහයේ දෙපසින් ඇති දොරටු ද්විත්වයෙහි කලාත්මක මකර සහ සිංහ තොරණ දෙකකි. ගර්භ ගෘහයේ සැරසිලිවලින් යුක්ත පුද්ගල ප්‍රමාණයේ විෂ්ණු දේව ප්‍රතිමාවකි. උක්ත සාධක මත ශ්‍රී ලංකාවේ පහතරට විහාරස්ථානයක් ලෙස බෙන්තර ගලපාත විහාරය විවිධ කලා අංගයන්ගෙන් පෝෂණය වී ඇති බව පැහැදිලිය.

ප්‍රමුඛ පද : බෙන්තර ගලපාත විහාරය, ගල් උලුවහු, දඹදෙණි යුගය, සිතුවම් සම්ප්‍රදාය

---

[1] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. bhagyagimhani@06gmail.com